රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:2/97(1v) මගේඅංකය: 1/543ඊ 01/35
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1997.11.28 දින.

සියළුම ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත

**1998 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම**
**රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රතිශෝධනය**

1997.01.15 දිනැති අංක: 2/97, 1997.04.30 දිනැති අංක: 2/97(1), 1997.08.28 දිනැති අංක: 2/97(11) සහ 1997.11.12 දිනැති අංක 2/97(111) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. උක්ත චක්‍රලේඛ යටතේ රු. 90,000/- ක්හෝ ඊට වැඩි නව ඒකාබද්ධ වාර්ෂික වැටුපක් නියම කරනුලැබ ඇති තනතුරු දරන නිලධාරීන් සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 2/97හි 2:2 ජේදයේ සඳහන් වැටුප් වැඩිවීමේ දෙවැනි අදියර වන වැඩිවීමෙන් සියයට 60 ගෙවීම 1998.07.01 දින සිට ක්‍රියාත්මක කිරීමට රජය තිරණය කර ඇත. මෙය අදළ වනුයේ සම්පූර්ණ වැඩිකිරීම් යටතේ ප්‍රතිශෝධිත නව වැටුප් පරිමාණයක ආරම්භක වාර්ෂික වැටුප් පියවර රු.90,000/ හෝඊට වැඩි වන තනතුරු සම්බන්ධයෙන් පමණකි. නිදසුනක් ලෙස අංක: 2/97(111) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් ටී-3-5 වැටුප් කාණ්ඩය (රු72,240-15x2460-109,140) නියම කරනුලැබූ තනතුරක් සම්බන්ධයෙන් වැටුප් වැඩිවීමෙන් සියයට 60, 1998.01.01 දින සිට ක්‍රියාත්මක වන අතර ටී-3-7-2 වැටුප් කාණ්ඩය (රු.90,360-14x2460-124,800) නියම කරනු ලැබූ තනතුරක් සම්බන්ධයෙන් වැටුප් වැඩිවීමෙන් සියයට 60, 1998.01.01 දින සිට නොව 198.07.01 දින සිට ක්‍රියාත්මක වේ.)

03. ඉහත පළමුවන ජේදයේ සඳහන් චක්‍රලේඛවලට අමතරව 1997.01.01 දින හෝ ඉන් පසු දිනෙක සිට ක්‍රියාත්මක වන සේ අමාත්‍ය මණ්ඩලය විසින් හෝආයතන අධ්‍යක්ෂ විසින් නියම කර ඇති වැටුප් පරිමාණ සම්බන්ධයෙන් ද මෙම විධිවිධාන අදළ වේ.

04. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයේ එකගත්වය ඇතිවය.

අ.කලේ/(ඩික්සන් නිලවීර),
ලේකම්,
රාජ්‍ය, පරිපාලන, ස්වදේශ කටයුතු
හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.